කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011

2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU- E2015

ක්‍රිස්තියානි ශාසනයේ ඉතිහාසය

එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) ඇතුලත් වනසේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි                    කාලය : පැය 03 යි

## පළමුවන කොටස - ලෝක සභා ඉතිහාසය

01. ක්‍රි.ව. මුල් සියවස් තුනේ දී ක්‍රිස්තියානි සභාවේ වර්ධනයට බලපෑ හේතු විස්තර කරන්න.

02. මුල් කාලීන සභාව මුහුණදුන් ක්‍රිස්තුවේදිය දූර්මත (Christological Heresies) තුනක් පැහැදිළි කරන්න.

03. එජිප්තුවේ ඇන්තනි තුමා සහ (250-356) සහ නූර්සියාවේ බෙනඩික්ට් තුමාගෙන් (480-547) ආභාසය ලැබූ ක්‍රිස්තියානි තාපස ක්‍රමයේ වර්ධනය සංසන්දනාත්මකව විමසන්න.

04. කුරුස යුද්ධ හේතු කොට ගෙන ඇතිවූ යහපත් සහ අයහපත් ප්‍රතිඵල පැහැදිළි කරන්න.

05. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳව සවිස්තර සටහන් ලියන්න.

අ. ගෝත්‍රික ආක්‍රමණ සහ ක්‍රිස්තියානි සභාව

ආ. ප්‍රතිමාභංගන අර්බුදය (The Iconoclast Controversy)

ඇ. ධර්මාධිකරණය (Inquisition)

ඈ. ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයට හේතු වූ කරුණු

ඉ. දෙවන වතිකාන මන්ත්‍රණ සභාව

## දෙවන කොටස - ලංකා සභා ඉතිහාසය

06. ක්‍රි.ව. 6 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ පැවති නෙස්ටෝරියානු සභාව පිළිබඳ ඓතිහාසික සාධක සහ 16 වන සියවසට පෙර මෙරට කිතු දහම පැවති බවට වන අනෙකුත් ජනප්‍රවාද කවරේද යන්න විචාරාත්මකව විග්‍රහ කරන්න.

07. 'ජුසේ වාස් පියතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති සහ වත්මන් ලාංකේය කතෝලික සභාව' යන මැයින් රචනාවක් ලියන්න.

08. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ආරම්භ වූ ලංකා එංගලන්ත සභාවේ වර්ධනය විස්තර කරන්න.

09. නිදහසින් පසු ලාංකේය ක්‍රිස්තියානි සභාවන්ගේ මූලික ප්‍රවණතා විචාරාත්මකව විග්‍රහ කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳව <u>සවිස්තර</u> සටහන් ලියන්න.

අ. පෘතුගීසි යුගයේ කෝට්ටේ රාජ්‍ය මුල් කර ගත් කතෝලික ධර්මදූත ප්‍රගමනය

ආ. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ හෙළ කිතුනු ලේඛන පිළිබඳ ඇගයීමක්

ඇ. ලංකා කතෝලික සභාව අපෝස්තලික විගාරි වසමක් ලෙස පැවති යුගය

ඈ. ලංකා මෙතෝදිස්ත සභාව

ඉ. බ්‍රිතාන්‍ය යුගයේ කිතුනු අධ්‍යාපනය

***********************